ගෙවතු වගාව

# බත රස කරන වට්ටක්කා



අපි පුංචි දවස්වල අපේ ගමේ හිටිය මල්හාමි මාමලා පිංහාමි මාමලා කිරිහාමි මාමලා වාගේ පැරණි උදවිය තම තමන්ගේ ජීවන රටාවේ එක අංගයක් හැටියට හේන් ගොවිතැන කලේ බොහොම උනන්දුවෙන්. ඒ ගොල්ලන්ගේ හේන් පිටිවල වගා කරපු බෝග ජාති අතරේ තැන් තැන්වල තිබුණ එක එක ප්‍රමාණෙ විශාල වට්ටක්කා ගෙඩි. ඒ වගාව තමන්ගේ ඕනෑ එපාකම්වලට සෑහෙන්න විතරයි කරන්න ඒ උදවිය පෙළඹුනේ.

කොහොම උනත් ඒ ගොල්ලෝ වට්ටක්කා වගාව කලේ අමුතුම ක්‍රමයකට. අළුතෙන් වල් ගිනි තියලා හද ගත්ත නව දලි හේන් වල වැස්ස පුරනකොට හොඳට අළුතියෙන තැන් කීපයක් බලල ඒ තැන්වල යන්තමට වලක් කපලා ඇට කීපයක් හිටවනවා. වැස්සට පැලවෙල මාස 1 1/2 ක් විතර වැල් ඇදෙනකොට හොඳට වල් නෙලලා මාස දෙකේදී විතර හිරමණ තලේකින් වැල්වල දළු කපනවා. ඊට පස්සේ වැල දිගට ඇදෙන්නෙ නැතිව වැලේ තැන් තැන්වලින් දළුත් මලුත් පල ගත්තා. අන්න ඒ විදිහටයි අපේ ගම්මු එද වට්ටක්කා වගාව කලේ.

ලෑතක් වෙන තුරුම අපි කවුරුත් වට්ටක්කා වගාව කෙරුවේ අපේ පැරන්නෝ කරපු ආකාරෙට. ඒ කියන්නේ සාම්ප්‍රදායික ක්‍රමේට. ඔහොම ඉන්න අතරතුරේදී තමයි කෘෂිකර්මේ උගන්නන්ට ශ්‍රේබ්‍රියෙල් ගුරුතුමා අපේ ස්කෝලෙට ආවෙ. කෘෂිකර්ම පාඩමේදී එතුමා ඉගැන්වූයේ නවීන ක්‍රමයට ගොවිතැන් කරන හැටි. වට්ටක්කා බෝගය ගැන එතුමා බොහොම යසට අපට කියලා දුන්නා. ගේබ්‍රියෙල් ගුරුතුමා උගන්නපු වට්ටක්කා වගාව පිළිබඳ පාඩමේදී ඒ ගැන කියවුනේ මෙන්න මේ විදියටයි.

දැනට අපේ රටේ වගාවෙන වට්ටක්කා දිග සහ රවුම කියලයි ප්‍රධාන කොටස් දෙකකට බෙදෙන්නේ. කුකර්බිටේසි කුලයට අයත් මෙම බෝගයෙහි උද්භිද නාමය කුකර්බිටා මැක්සිමා යන්නෙන් හැඳින්වෙනවා. හොඳින් හිරු එළිය ලැබෙන වැලිලෝම පසේ සිට මැටිලෝම පස දක්වා පසක්ද, ෆැ. අංශක 75 සිට 85 දක්වා උෂ්ණත්වය ඇති උෂ්ණ දේශගුණයක් හා වගා කාලය තුළ පැතිරුණු වර්ෂාපතනයක්ද මෙම බෝගය හොඳින් වැඩීමට අවශ්‍යයයි.

වට්ටක්කා ඇට හිටවන්න ඉස්සරවෙලා හොඳට බිම සකස් කරගන්න වෙනවා. හිටවන බිමේ කුණු රොඩු දලා පුළුස්සා ගන්නේ පළිබෝධකයන් වලක්වා ගන්නයි. ඊට පස්සේ බිම සීසාලා රනිල බෝගයක් වගා කරල ඒක පසට යටකර ගැනීම හෝ කොම්පෝස්ට් පෝර යොදලා හැරෝ කර ගැනීම හෝ කරන්න වෙනවා. බිම කැබැල්ල කුඩානම් උදලු මුල්ලු ආදියෙන් පෙරලා ගැනීම වඩාත් පහසුයි. පස සකස් කරගත්තාට පස්සේ අඩි 10 ක පරතරයක් හිටින්න වලවල් කපාගන්න ඕනෑ. වලක ගැඹුර හා පළල අඩි 1 1/2ක පමණ විය යුතුයි. කපාගත් වලකට කොම්පෝස්ට් හෝ ගොම කූඩයක් හෝ එකහමාරක් යොදා පසට කලවම් කරගන්න ඕනෑ. එම පසේ බීජ ඇට 4 බැගින් සිටුවිය යුතුයි. කෙලින්ම ක්ෂේත්‍රයේ සිටුවන මෙම බෝගය සඳහා අක්කරයකට බීජ ඇට රාත්තල් එකක් හෝ එකහමාරක් පමණ අවශ්‍ය වෙනවා.

ජලසම්පාදනය කරනවා නම් පැලවෙන තුරු දිනකට වරක් බැගින්ද පැලවී සති තුනකින් පමණ පසු සතියකට වරක් බැගින්ද කල යුතුයි. බීජ පැලවීමට දින 4 ක් පමණ ගත වෙනවා. පැලවී සති දෙකකට පසු දුර්වල පැල දෙකක් ඉවත් කළ යුතුයි. වැල් ඇදීමට කලින් වල් මර්ධනය කිරීම අවශ්‍ය වෙනවා.

වට්ටක්කා වගාවේදී රසායන පෝර භාවිතා කරනවා නම් මූලික මිශ්‍රණය සඳහා :

| | | |
|---|---|---|
| යූරියා - | රාත්තල් | 186 2/3 |
| සා:සු:පො: - | රාත්තල් | 311 1,9 |
| මියු: පො:- | රාත්තල් | 62 2/9 |

අක්කරයකට මිශ්‍රණය හොන්ඩර 5 ක් යෙදිය යුතුය.

බෝග සිටුවා මසකට පසු නැවත මතුපිට යෙදීම කළ යුතුය.

| | | |
|---|---|---|
| යූරියා - | රාත්තල් | 37 1/3 |
| සා:සු:පො: - | රාත්තල් | 62 2/9 |
| මියු: පො: - | රාත්තල් | 12 4/9 |

අක්කරයකට මිශ්‍රණය හොණ්ඩර 1 ක් යෙදිය යුතුය.

කැළණි විශ්ව විද්‍යාලයේ.
ඒ. හේරත් බංඩා
විසිනි

අනතුරුව මාස දෙකකට පසු තුන්වන මතුපිට යෙදීම කළ යුතුය. ඉහත මිශ්‍රණයෙන්ම අක්කරයකට හොණ්ඩර 1 බැගින් වන පරිදි යෙදිය යුතුය.

වට්ටක්කා බෝගයෙන් මාස තුනක් තුනහමාරක් අතර කාලයේදී අස්වනු නෙලන්න පුළුවන්. අක්කරයකට රාත්තල් 20000 ක පමණ මේ වගාවෙන් අස්වනු ලබා දෙනවා.

ඉස්සර අපේ ගම්වැසියෝ වට්ටක්කා වගාව කෙරුවේ තමන්ගේ ආහාරය සඳහා පමණයි. ඒත් අද ඒ සඳහා හොඳ වෙළඳපොලක් තියෙනවා. අපේ පුංචි නංගිලා මල්ලිලාට මේක බොහොම පහසුවෙන් කරන්න පුළුවන් වගාවක්. තමන්ගේ ගෙවත්තේ හේනෙ පිට්ටියේ. කුඹුරේ සුදුසු තැනක මේ වගාව කරන්න පුළුවන්. නූතන ක්‍රම වගේම පැරණි ක්‍රමත් භාවිතා කරන මේ වගාව කළාම වෙනස තේරුම් ගන්න පුළුවන් වේවි. හැබැයි පැරණි ක්‍රමවල සත්‍යයක් නැත්තේම නැහැ. වට්ටක්කා වගාවේදී දළු කැපීම ඉතාමත් සාර්ථක ක්‍රමයක්. පැරැන්නෝ දළු කැපීමට භාවිතා කළේ හිරමණ තලයක්. ඒකේ ගොරෝසු බව හා තෙල් ගතිය නිසා දළු ඉක්මණින් සුව වෙන්න පුළුවන්. ඒකයි ඒකේ විද්‍යාත්මක පැත්ත.

ඔබට මහා පරිමාණ හෝ සුළු පරිමාණ වශයෙන් මේ වගාව කරන්න පුළුවන්. කොහොම උනත් වගාව කරනවා වාගේම කෘමීන්ගෙන් හා රෝග වලින් වගාව ආරක්ෂා කරගන්නත් වෙනවා. දැන් අපි බලමු කෘමීන් මේ වගාවට හානි කරන්නේ කොහොමද කියලා.

අවුලකපෝරා, එපිලැග්නා, ඉල්මැස්සා, හබල්පාද මකුණා ආදී හානිදයක කෘමීන් සහ සුළු වශයෙන් හානි කරන රතු පස් මුළු මකුණා සහ ජලූසියා පොපොනිස් ආදී කෘමීන්ගෙන් මේ වගාව ආරක්ෂිත කරගත යුතුයි. අවුලකපෝරා කොල සහ මල් වලට හානි කරන අතර ඒ සඳහා බී.එච්.සී කුඩු, මැලතියන් ආදිය යෙදීම මැනවි. එපිලැග්නා පත්‍රවල අපිචරන කොටස් හෙවත් මදය කා දමයි. මැලතියන් පෙනිට්‍රොතියන්

(30 වැනි පිටුවට)

## බත රස.........

### 24 වැනි පිටුවෙන්

ආදිය ඒ සඳහා සුදුසුයි. ඉල්මැස්සා ලපටි ගෙඩි වලට හානි කරයි. ඒ සඳහා ලෙඩයිසිඩ් වැනි කෘමි නාශකයක් යෝග්‍යය. හබල්පාද කෘකුණා කඳන්වල සහ වැල්වල යුෂ උරාබීම නිසා පැලෑටි වියළීම හා එලවැටීම සිද්‍ධවෙයි. ඒ සඳහා මැලතියන් යෙදීම සුදුසුයි.

වට්ටක්කා වගාව සඳහා වැලදෙන රෝග අතර පිටිප්‍රස් රෝගය සහ විචිත්‍ර වයිරස් රෝගය විශේෂයක් ගනී. තෙතමනය වැඩිකර පිටිප්‍රස් රෝගය වැළඳීමට හේතු කාරකයකි. සිනෙබ් දිලීර නාශකය මෙම රෝගය සඳහා සුදුසුය. විචිත්‍ර වයිරස් රෝගය නිසා පත්‍රවල කොළපාට සහ කහපාට කොටස් ඇතිවේ. පසුව තද කොළපාට හෝ ලා කහපාට සහ කහපාට විචිත්‍රයක් සෑදේ. රෝගය වැළඳුනු පසු පළමුවෙන් පත්‍ර හැකිලී පුරුක් කඩාවී වැල් වැඩීම නවතී. මල් හට ගැනීමද දුර්වල වේ. මල් මෙරීමට ප්‍රථමට ප්‍රථම වියළී ඇද හැලේ. විශාල වශයෙන් මෙම රෝගය පැතිරයන්නේ කුඩිත්තන් මාර්ගයෙනි. කුඩිත්තන් මර්ධනයෙන් පැතිරයාම වළක්වා ගත හැක.

රෝගකාරක, කෘමි සත්තු ආදී සියල්ලටත් වඩා මේ වගාවේදී අපි සැලකිලිමත් වන්න වෙනවා වගා කාලය තෝරා ගැනීම පිළිබඳව. දිග වැසි සමයක් ඇත්නම් එනම් මාස 4 ක පමණ අපට මේ වගාව වැසි ජලයෙන්ම කරන්න පුළුවන්. ඒත් වැස්ස අඩු ප්‍රදේශවල වැසි සමය ආරම්භ වීමට මසකට පමණ පෙර බිම සකස් කර බීජ සිටුවා වෙනත් ජල සම්පාදන ක්‍රමයක් යොද ගැනීම තරමක් අපහසුමුත් වඩා වාසිදයකය. වැසි සමය ආරම්භවීමත් සමඟ වැල් වැඩීම ඉක්මන් වීම හා පල ලැබීමද ඉක්මන් වීම හා පල ලැබීමද ඉක්මන් වේ. ඒ නිසාම හොඳ වෙළඳ පොලක්ද ලැබෙනු ඇත. පූර්ණ කාලීන ජල සම්පාදනයට වඩා වැසි ජලයේද උපකාරයෙන් මේ වගාව කිරීම වඩා පලදායීකද, වඩා පහසු දයිකද වනු ඇත.